**ශීර්ෂය - 311 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

ජාතික භෞතික සැලසුම්දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍යප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍යප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරවමූල්‍ය ප්‍රකාශනඉකුත් වර්ෂය සමග අනුරූපීව ඉදිරිපත් කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පුනරාවර්තන වියදම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් තුල වැය විෂයය අංක 1701 (පාඩු හා කපාහැරීම්) යටතේ රු.73,661 ක වියදම් දරා තිබුණද පුනරාවර්තන වැය ලෙජරයේ එම අගය සටහන් කර නොතිබුණි. | පුනරාවර්තන වැය ලෙජරය යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | පුනරාවර්තන වැය ලෙජරයට ඇතුළත් කර නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුලදී කතරගම විශ්‍රාම ශාලා දෙක පවත්වාගෙන යාමේදී ජලය හා විදුලිය සඳහා පමණක් රු.602,066 ක වියදම් දරා තිබුණු නමුත්, එක් විශ්‍රාම ශාලාවකින් කිසිදු ආදායමක් ලැබී නොතිබුණු අතර අනෙත් විශ්‍රාම ශාලාවෙන් වර්ෂය තුලදී රු. 383,900 ක් පමණක් ආදායම් ලෙස ලැබී තිබුණි. | දෙපාර්තමේන්තුවට අලාභයක් නොවන පරිදි සුභසාධන කටයුතු පවත්වා ගෙන යායුතු වීම. | කතරගම විශ්‍රාම ශාලා අළුත්වැඩියා කටයුතු කරමින් පවතී. |

**(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව තුල දැනට සේවය නොකරන නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු හිඟ ණය ශේෂය රු.1,346,632 ක් වූ අතර හිඟ හිටි කාලය වර්ෂ 5 ඉක්මවූ සේවය අතහැරගිය කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ආපදා ණය ශේෂය රු.30,000 ක් විය. | හිඟ ණය ශේෂයන් පියවා ගැනීමට කටයුතු කල යුතු වීම. | මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

(ඇ) **දේපල පිරියත හා උපකරණ**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී පසුගිය වර්ෂයේ අවසාන ශේෂය සඳහා ගැලපීම් සිදුකර සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය හඳුනාගෙන තිබුණු නමුත් එම ගැලපීම් සඳහා ලබාගත් පසුගිය වර්ෂයේ අවසාන ශේෂයන්හි එකතුව රු.5,000,181 කින් අධිප්‍රමාණය වී තිබුණි. | විගණිත මූල්‍ය ප්‍රකාශන වලින් ලබාගත් නිවැරදි ශේෂයන් ඉදිරියට ගෙන ආ යුතු වීම | කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ ගිණුම් අතර අගය මාරු වීමක් සිදු වී ඇත. |
| (ii) | දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමශාලා 03 ක් සහ රථගාලක් ඉදිකර තිබුණද එම ඉදිකිරීම් සහිත ඉඩම් අත්පත් කරගෙන නොතිබුණු අතර, එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක්ද සිදුකර නොතිබුණි. | වත්කම් නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතු විම. | ඉදිකිරීම් වලට අදාල ඉඩම් දෙපාර්තමේන්තුව සතු නොවන අතර ඒවා අත්පත් කර ගැනිමට කටයුතු ආරම්භ කර ඇත. |
| (iii) | 2019 මාර්තු 19 දිනැති දරන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි 2019 මැයි 31 දින දෙපාර්තමේන්තුව සතු රු. 3,580,000 ක් පමණ වටිනා වාහන 03 ක්<br><br>අනුරාධපුර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත භාරදී ඇති නමුත් මූල්‍ය ප්‍රකාශනවලඅදාල වත්කම් පැවරීම් ගිණුම් ගතකර නොතිබුණු අතර එසේම කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙතද මෙම වාහන පිළිබඳ විස්තර වාර්තා කර නොතිබුණි. | වත්කම් පැවරීම නිවැරදිව හා විධිමත්ව සිදුවිය යුතුවීම. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි වාහන 03 ක් අනුරාධපුර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත භාරදුන නමුත් තවමත් එම පැවරිම ගිණුම් ගත නොකර ඇති අතර එය ඉදිරියේදී යාවත්කාලින කිරිමට කටයුතු කරනු ලබයි. |
| (iv) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි දෙපාර්තමේන්තුව විසින් තානායම්, නිල නිවාස, සංචාරක බංගලා හා කාර්යාල හා ගොඩනැගිලි සඳහා කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කල මූල්‍ය නොවන වත්කම් | මූල්‍ය නොවන වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් ඒ අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කල යුතු විම. | මෙම වත්කම් වලින් රු.19,615 ක් ඉඩම් ලෙසද, රු.36,500 ක් සංචාරක බංගලා ලෙසද, රු. 6,950 ක් කාර්යාල ගොඩනැගිලි ලෙසද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ලේඛනය හා මූල්‍ය ප්‍රකාශනවල එම අගය අතර එකතුව රු. 3,615,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | | |
| (v) | යථෝක්ත චක්‍රලේඛය අනුව දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කල මූල්‍ය නොවන වත්කම් ලේඛනයේ ඇතුලත් වූ රු. 5,600,000 ක් වටිනා දරන වාහනය ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු විම. | මූල්‍ය නොවන වත්කම් ලේඛනය ඉදිරියේදී යාවත්කාලින කිරිමට කටයුතු කරනු ලබයි. |

**(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ස්ථාවර වත්කම් ලේඛණය**<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගත යුතු වුවද ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ, කාර්යාලීය උපකරණ, විද්‍යුත් උපකරණ, සන්නිවේදන උපකරණ, ගෘහ භාණ්ඩ, කාර්මික හා කාර්මික නිෂ්පාදන උපකරණ, ඉදිකිරීම් උපකරණ සහ කෘෂිකාර්මික උපකරණ හා කිරි ගොවිපල උපකරණ වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | යොමුගත චක්‍රලේඛයන් ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගත යුතු විම. | ස්ථාවර වත්කම් ලේඛණ සකස් කරමින් පවතී. |

(ඉ) **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුව තුල මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනයන් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයේ ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එම පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන වලට අනුකූල විය යුතු වීම. | ඉදිරියේදී මේ අනුව කටයුතු කරනු ලබයි. |

(ඊ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**නිරීක්ෂණය**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රු.822,766 | නිල වාහන හිමිකම් ඇති නිලධාරීන් සඳහා අතිරේක ඉන්ධන ප්‍රතිපාදන නොඉල්ලිය යුතු අතර, බැහැර ප්‍රදේශයන්හි රාජකාරි සඳහා අමාත්‍යාංශලේකම්ගේ අනුමැතිය මත කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසනු ලැබුවද සමාලෝචිත වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වෙත ගෙවූ අතිරේක ඉන්ධන ප්‍රමාණය එම නිලධාරියාට වර්ෂය තුල හිමි සාමාන්‍ය ඉන්ධන දීමනාව මෙන් සිව් ගුණයකටත් වඩා වැඩි බව නිරීක්ෂණය විය. | යොමුගත චක්‍රලේඛයට අනුකූල විය යුතු වීම. | නිරීක්ෂණය සමග එකඟ වී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සංචාරක බංගලාවන්හි නවාතැන් ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු හිඟ හිටි ආදායම රු. 346,200 ක් විය. ඒ තුල සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟ ආදායම රු.83,300 ක් වූ අතර, ඉතිරි රු.262,900 ක හිඟ ආදායම වර්ෂ 01 සිට 05 දක්වා කාලයක් හිඟව පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ ආදායමෙන් සියයට 98 ක් එනම් රු.340,200 ක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතුව තිබුණි.. | හිඟ ආදායම් අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කළ යුතුවීම. | ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රමාණවත්ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු නොකර වැය විෂයයන් 05 ක් සඳහා මු.රෙ.66 මාරුකිරීම් මඟින් සියයට 30 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන මාරු කිරීම් සිදුකර තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු නිවැරදිව සකස් කල යුතු වීම. | ඉදිරියේදී හැකිතාක් නිවැරදිව වාර්ෂික ඇස්තමේන්තු සකස් කරමි. |
| (ආ) | වාහන නඩත්තු වියදම්, වෙනත් වියදම්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | වාර්ෂික ඇස්තමේන්තු නිවැරදිව සකස් කල යුතු වීම. | අයවැය චක්‍රලේඛයඅංක 07/2019 මඟින් වසර අවසාන රාජ්‍ය වියදම් කළමනාකරණය කරන ලෙස දන්වා තිබීම නිසා අදාල කාර්යයන් සිදුකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් සියයට 40 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | | |
| (ඈ) | යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් දෙපාර්තමේන්තුව සඳහා වෙන්කළ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.47,554,000 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.4,881,424 ක් පමණක් වියදම් කර තිබූ අතර, මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 90 ක් එනම් රු. 42,672,576 ක් ඉතිරිවී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු නිවැරදිව සකස් කල යුතු වීම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉඩම ලබාදීම ප්‍රමාදවීම නිසා සැලසුම් කල පරිදි කටයුතු සිදුකිරීමට නොහැකිවිය. |
| (ඈ) | අවශ්‍යතා අනුව වාර්ෂික ඇස්තමේන්තු මගින්ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු නොකර රු. 2,050,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සහිත ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය සඳහා මු.රෙ.66 මාරුකිරීම් මගින් සියයට 119ක් එනම් රු. 2,446,000 ක ප්‍රතිපාදන මාරු කර ගැනීම සිදුකර තිබුණි. | හැකිතාක් නිවැරදිව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතු විම. | ප්‍රතිපාදන ඉතිරිවේයැයි අපේක්ෂිත වැය විෂයයකින් මාරු කර ගන්නා ලෙස ලිඛිත උපදෙස් ලැබී ඇත. |

**2.3** බැරකම් හා බැඳීම්වලට එළඹීම
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | -------------------- |
| (අ) | මුදල් රෙගුලාසි 115(2) ප්‍රකාරව පූර්ව වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ගෙවිය යුතු හිමිකම්පෑම් නොවැළැක්විය හැකි තත්ත්වයන් යටතේ පමණක් ඊට පසු වර්ෂයේ මාර්තු මාසය අවසන්වීමට පෙර ගෙවිය හැකි වුවද 2019 වර්ෂයේ බැරකම් ලෙස සඳහන් කර ඇති එකතුව රු. 201,673 ක වියදම් 2020 මාර්තු මාසය අවසන් වන විටද ගෙවීම් කර නොතිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව බැඳීම් වලට එළඹීම හා ගෙවීම් කිරීම සිදු කළ යුතු විම. | සමාලෝචිත වර්ෂයේදී වියදම් ගෙවා අවසන් කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 115(3) ට අනුකූල නොවන පරිදි 2019 මාර්තු මාසයේදී ආපසු ගෙවිය යුතු රු.175,950 ක රදවාගත් මුදලක් ආපසු ගෙවීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණු අතර, 2020 ජනවාරි මාසයේදී එම මුදල සැපයුම්කරු වෙත ගෙවා තිබුණු නමුත් 2019 වර්ෂයේදී බැරකම් ලෙසද ගිණුම්ගතකර නොතිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව බැදීම් වලට එළඹීම හා ගෙවීම් කිරීම සිදු කළ යුතු විම. | 2020 වර්ෂයේදී වියදම් ගෙවා අවසන් කර ඇත. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දුරකථන වියදම රු.29,906 ක් වුවද 2020 මාර්තු මාසය අවසන් වන විට පසුගිය වර්ෂයේ දුරකථන වියදම් ලෙස රු.30,862 ක් ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂිකව වියදම් හා බැදීම් ගිණුම් ගත කල යුතු විම. | නිරීක්ෂණය සමග එකඟ වී ඇත. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත කතරගම පූජා නගර සංවර්ධන ව්‍යාපෘතිය, රාජ්‍ය වෙසක් උත්සවය හා එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ වෙතින් ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු. 60,078,849 ක්, රු. 257,908 ක් හා රු. 115,431 ක් එනම් සියයට 60, සියයට 56 සහ සියයට 12 බැගින් ඉතිරිවී තිබුණි. | නිවැරදිව හා සම්පූර්ණව ඇස්තමේන්තු සකස් කළ යුතු විම. | එම කාර්යයන් අවසන් නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නිලධාරීන් දෙදෙනෙකු වෙත 2019 වර්ෂයේදී ලබාදුන් එකතුව රු.16,000 ක අතුරු අග්‍රිමයන් පියවීම සඳහා මාස 1 ½ සිට මාස 04 දක්වා කාලයක් ගතවී තිබුණි. | අත්තිකාරම් පාලනය විධිමත් කළ යුතු විම. | හැකිතාක් නිවැරදිව අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම කරයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිලධාරීන් තිදෙනෙකු වෙත ලබාදුන් එකතුව රු. 24,000 ක අත්තිකාරම් දින 10 කට ආසන්න කාලයක් කිසිදු කාර්යයක නොයොදා මුළු මුදලම නැවත පියවා තිබුණි. | අත්තිකාරම් පාලනය විධිමත් විය යුතු වීම. | ඇගයීම් කර හැකිතාක් නිවැරදිව අත්තිකාරම් නිකුත් කරයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අනුව අනුරාධපුර ලෝලුගස්වැව ව්‍යාපෘතිය යටතේ උප කාර්යයන් 05 ක් සඳහා රු.මිලියන 45 ක් වෙන්කර තිබුණු අතර අදාල කාර්යයන් 2019 වර්ෂය අවසන් වන විට නිමකිරීමටද සැලසුම් කර තිබුණු නමුත් එහි එක් උප කාර්යයක් එනම් ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීමේ කටයුතු පමණක් ආරම්භ කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතියද සියයට 70 ක් පමණක් විය. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු වීම. | ව්‍යාපෘතියට අදාල ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා නොතිබීම. |
| (ආ) | කතරගම පූජා භූමියේ සැලසුම්ගත ඉදිකිරීම් 08 කින් උතුරු පිවිසුම අසල, ව්‍යාපෘති කාර්යාලය අසල හා කිරිවෙහෙර පිවිසුම අසල පහසුකම් සහිත ගොඩනැගිලි 03 ක් ඉදිකිරීමේ වැඩ සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරීමට සැලසුම් කලද එහි ප්‍රගතිය සියයට 70 ක් පමණක් විය. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු වීම. | පොලිස් මුරපොල 04 ක් හා ආරක්ෂිත වැටක් ඉදිකර අවසන් කර ඇත. |

**3.2** **ප්‍රසම්පාදනයන්**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික භෞතික සැලැස්මේ මුද්‍රණ කටයුතු හා අනෙකුත් රැස්වීම් වෙනුවෙන් රු.මිලියන 05 ක් ප්‍රසම්පාදන සැලැස්මේ වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම කාර්යයන් සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම විධිමත් විය යුතුවීම. | භෞතික සැලස්ම නැවත සංශෝධනය කිරීමට තීරණය කර ඇත. |
| (ආ) | 2019 වාර්ෂික ප්‍රසම්පාදන සැලස්මේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා රු. 750,000 ක් හා කතරගම පූජා භූමියේ රථගාලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 12.5 ක් වෙන්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම කාර්යයන් අරම්භකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම විධිමත් විය යුතුවීම. | භෞතික සැලස්ම නැවත සංශෝධනය කිරීමට තීරණය කර ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී නාම පුවරු සකස් කිරීම සඳහා රු.222,300 ක් වියදම් කර තිබුණු නමුත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි එම කාර්යයන් ඇතුළත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම විධිමත් විය යුතුවීම. | භෞතික සැලස්ම නැවත සංශෝධනය කිරීමට තීරණය කර ඇත. |